# 29

ගිල්ඩා දුනුවිල පියානෝව අසල බංකුවෙහි හිඳ තමා අසල සිටි සුලෝචනාට පියානෝවේ යතුරු හා ස්වර ගැන කියා දෙද්දී කෝණයේ හිඳ ගත් බිමල් උනන්දුවෙන් බලා සිටියේය.

"මේ තමයි ලෝනා - සී නෝට් එක"

ගිල්ඩා සුලෝචනාව ඇමතුවේ "ලෝනා" කියායි. සුලෝචනාව හඳුන්වා දී තිබුණේ ලෝනා කියායි.

"අපේ ආච්චි ලෝනා ඩූන් කියන පොතට හරි ආසයි. ඒකයි මට ලෝනා කියල නම දීල තියෙන්නෙ," සුලෝචනා තොදොල් බවක් මවා කීවාය. ඈ උගත් රංගන පන්ති ඇයට උදව් වුනා වගේය - මේ රංගනයට.

බිමල්ට සතුටක් දැනුණි. බිමල් ද දැන් "බිමල්" නොවීය. බිමල් තමාව හඳුන්වා දුන්නේ "බියන්කා" යන නමිනි.

බියන්කා, නිර්මලාගේ බියුටි සැලෝන් එකේදී හැඩවී - ඇගේ බොරු කොණ්ඩයක් පැළඳ, ඈ මසා දුන් අලුත්ම ගවුමක් හැඳ අතේ වළලු පැළඳ, තිලක, තොල් රතු කර සිටියාය.

බියන්කා ඇත්තෙන්ම සිත් අදනා රූ සපුවෙන් යුතු වූවාය.

බියන්කා කීවේ 'ලෝනා' තමාගේ අයි කොනොපූරියක් බවයි. බියන්කාත් ලෝනාත් එකම මවකට, පියවරුන් දෙදෙනෙකුගේ උපන් නිය කිවුන් කියා සිටියේ. මවගේ මරණින් පසු ලෝනාව බලා කියා ගත්තේ බියන්කා බව බියන්කා කීවාය. "මගෙත් තාත්තා නෑ" බියන්කා බොරු ගොතමින් සියුම් උස් හඬින් කීවාය. "ලෝනාගෙ තාත්තා වෙන කෙනෙක් බැඳල, ගියා -"

"ඔයා හොඳ සිස්ටර් කෙනෙක් බියන්කා" ගිල්ඩා පැහැදී කීවාය.

"නංගිට පියානෝ ඉගෙන ගන්න ආසාවක් තිබුණා හැමදාමම. පත්තරේ ඇඩ් එක දැකල අපි ආවෙ." බියන්කා, තවත් බොරුවක් කීවාය.

"හවු නයිස්!" ගිල්බා කීවාය. "උගෙන ගන්න, වයස් ප්‍රශ්නයක් නෑ. ලෝනා ගෙ වයස කීයද?"

"මට දහ අටයි" ලෝනා කීවාය

"මට විසි දෙකයි" නියන්තාගෙන් කාවත් බොරුවක්.!

"මං ආසා ඩාන්ස් කරන්න."

"කොච්චර හොඳයිද?" ගිල්බා කීවාය. "ක්ලබ්ස් වලට එහෙම යනවද?"

"ඔව්" නියන්තා කීවාය. "උඩ පිට යනව,"

"කවුරුද එන්න පුළුවන්?"

"මේ එක්කෝ ඩේලි එන්න පුළුවන් - නේද ලෝනා?"

"ඔව් අක්කි."

"එහෙනං වීක් එන්ඩ් එකට එන්න. අපි ලෙසන් එකක් කරමු." කී ගිල්බා, ලෝනාව පියානෝව අසල වාඩි කරගත්තේ ඒ මොහොතේය.

සෝෆාවේ හිඳගත් බිමල් (නියන්තා) පීනේටක් මත තිබූ පුවත් පතක් අතට ගත්තාය.

"පන දින පුවත් පතක් -! තාත්තා වැඩ කළ පුවත් පත!"

මුල පිටුවෙහි වූ වර්ණ ඡායාරූපයක මිනිසුන් දෙදෙනෙක් පෙනී සිටියහ. පුරුදු මුහුණක් බවින් නියන්තා ඡායාරූපයට යටින් වූ පුවත්තිය කියවන්නට වූවාය.

"ධනවත් ව්‍යාපාරිකයෙකු වූ සමන් බංඩාර ඇහැලේගම තමාගේ සියලු ව්‍යාපාරයන් හා ඉඩම්, හන්දුර කලපුවේ ඉඩම් හිමි ව්‍යාපාරිකයෙකු වන කාලිංග දියවඩන ට විකුණා පවරා, ඉංගලන්තයේ වෙසෙන තම දරුවන් සමඟ විශ්‍රාමික සුවයෙන් ජීවත් වීමට ගිය බව" ය පුවත්තියේ කියැවුණේ.

සමන් බංඩාර ඇහැලේගමත්, කාලිංග දියවඩනත් සුට් බූට් හැඳගෙන, කර පටි බැඳගෙන එකිනෙකාගේ කරවටා අත් දමා ගෙන ඉන්නා ඡායාරූපයකි එයට උඩින් වූයේ. දෙදෙනාම සතුටින් - හාස් කිතුරන් වගේ. කාලිංග දියවඩනගේ මුහුණ නියන්තා එක්වනම හැඳින්නාය. තමා එදා කලපුව අසල යනවිට දිලිසෙන කළු පාට කාර් එකකින් ආවේ මේ මිනිසාමයි!

' සමන් බණ්ඩාර ඇහැළෙගම ඇත්තටම රට යන්නම ඇද්දැයි ' සැකයක් නියන්තා තුළ ඉපදුණා විය.

ගිල්බට් පියානෝවේ සරල සංගීත ඛණ්ඩයක් ඉතා මියුරු නැලවිලි හඬකින් වාදනය කළාය. නොසිතාම, නියන්තාගේ නෙත ඒ දෙසට ඇදී ගියේය. ගිල්බට් තද නිල් පැහැ සාරියක් ගත බැඳ සිටී. ඇගේ සියුරු ඇඟිලි, පියානෝවේ යතුරු පුවරුව මත ඈත මෑත යන්නේ අති සියුම් ආකාරයෙනි.

"ඩෝ - රේ - මී - ඩෝ - රේමී" ඇ මියුරු හඬින් කියයි.

'ඊළඟට ලෝනා සරල කොටසක් වාදනය කළාය.

"ඔන්න ඔය සිංදු ප්‍රැක්ටිස් කරන්න ලෝනා." කියමින් ගිල්බට් බංකුවෙන් නැගිට්ටාය. "ඉන්න මං ඔයා දෙන්නට තේ හදාගෙන එන්න."

ඇ ඇතුළු ගෙට ගියේ "ඇල් වී" කියමින් හඬ නගමිනි.

නියන්තා ලෝනා දෙස බැලුවාය. ලෝනා, පියානෝවේ යතුරු හඬවමින්ම නියන්තා දෙස බලා ඇසක් ගසා ඉඟි කළාය.

"ගුඩ් වර්ක් නංගි" නියන්තා උස් හඬින් කීවේ පෙරළා ඉඟි කරමිනි.

දොර සීනුව නාද විය. නියන්තා දොර අසට යද්දී ලෝනා වාදනය නතර කළාය. දොරෙන් පිටත සිටි තරුණිය නියන්තා හඳුනුවේ නැත.

" හලෝ - මං ලෙක්සි - ආන්ටි ගිල්බට් ඉන්නවද ? "

'හා එහෙනං මේ තමයි එදා රාත්‍රියේ මේසා හා කතා කළ අනෙක් තැනැත්තිය ' නියන්තාට සිතන්න ගියේය. 'මෙතින් ලස්සනයි. අංගර සංගර පාන කෙනෙක් වාගේ. මාත් මේ විදියටම හැඩිරෙන්න ඕනෑ. '

" පොඩ්ඩක් ඉන්න මෙතන. මං ආන්ටිට කියන්න " කී නියන්තා, ලෙක්සිට ගෙට ඇරයුම් කළාය.

දොර සීනුව හා කැතලිනා දැසිල්වා ගිල්ඩා ශාලයට ආවාය.

"හාං මේ ලෙක්සිනෙ!"

"ඔව් ආන්ටි - මේසන් නාම නැනෙ?"

"අද අසයින්මන්ට් එකක් තිබ්බා - නිගොම්බෝ වල"

"ඔව් - මේ ආන්ටි අර කාලිංග ලාගේ වර්ෂය පාටි එක කවද කිව්වද?"

"විසි අටනෙ? ට්වෙන්ටි එයිට්ත්. ෆුල් මූන් පුර පෝය දවසෙ" ගිල්ඩා කීවාය. "තව කල් තියෙනවා ලෙක්සි."

"ෆුල් මූන් නං හොඳට තියේවි - නේද ආන්ටි?"

"ඔව් ඔව් සිය දෙන්නම එනවනෙ?"

"ෂුවර් - ව" කී ලෙක්සි බියන්කා දෙස හොඳින් බැලුවාය.

"ආං ලෙක්සි මේ බියන්කා, එයාගෙ සිස්ටර්ගෙ පියානෝ ලෙසන් එකට ආවා."

"මං හිතුව පාටි ගර්ල් කෙනෙක් කියලා!" කී ලෙක්සි සිනාසුනාය.

ගිල්ඩා ප්‍රශ්නාර්ථව බියන්කා වෙත බැල්මක් හෙලා. "මෙයාට ඩාන්ස් කරන්න නං පුලුවන් කිව්වා," කියා කීවාය. "නේද බියන්කා?"

"පුලුවන් ආන්ටි. පොඩි කාලෙ ඉඳලම මං ඩාන්සිං වලට ආසයි. මොකද්ද ආන්ටි පාටි එක?"

"අපේ යාලු කෙනෙගෙ-" ගිල්ඩා කීවාය. "ලැගූන් එකේ."

"මෙයාවත් එක්කන් යමු ආන්ටි-" ලෙක්සි කීවාය.

"ද මෝ ද මෙරියර් - නේද?" ගිල්ඩා කීවාය.

බියන්කා කිසිවක් නොදන්නා කෙනෙක් මෙන් අන්දුන් කුන්දුන් බලද්දී ගිල්ඩා "අයිල් ටෙල් යූ ලේටර්" කීවාය.

ලෙක්සි තමාට ඇවිත් තිබූ ලිපි කීපයක් ටීපෝව මතින් ගෙන සවුගෙන ඉහල මාලයට ගියාය.

ඇල්ෆි ටී ගෙන ආ බැවින් පියානෝ පාඩම

මදකට නතර විය.

"නියන්තාට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවද ?" ගිල්බා තේ බොන අතරේ විමසුමක් කළාය.

"ඉඳලා බ්‍රේක් උනා" නියන්තා කීවාය.

"මටත් කවුරුත් නෑ" ලෝනා කියද්දී

"මෙයා ඊටත් වඩා කෙනෙකුට ආසයි" කියා නියන්තා ඇසක් ගැසුවාය.

ලෝනාගේ මුහුණ රතුවිය.

"අනේ ආයි - අක්කා !" ලෝනා තව ටිකෙන් "අයියා" කියයි.

"කට කට නංගි පරිස්සමෙන්" නියන්තා එසේ කීවාට එහි අරුතක් ගිල්බාට වැටහුණේ නැත.

තේ පානයෙන් පසු ලෝනා සමඟ පියානෝවට නැඹුරු වූනාය. නියන්තා පත්තරයක පිටු පෙරළුවාය.

නිමල්ගේ යටි හිත වලි කෑවේ කවදු තමාට කාන්තා දකින්නට ලැබේවිද යන සිතුවිල්ලෙයි.

පියානෝ පන්තියෙන් පසු තමන් එන බව කියමින් දෙදෙනා ගිල්බා දුනුවිලගෙන් සමුගත්තා.